# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2415/63 - 2024 දෙසැම්බර් මස 20 වැනි සිකුරාදා - 2024.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2023/101.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.27 වන දින අංක 2399/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.07.29 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණී මිය, 181/4බී, ජයතිලක මාවත, වරාගොඩ, කැළණිය.
2. ආචාර්ය පී. සී. ගිරිහාගම මයා, 206 එෆ්, ගල්ගේඩියන පාර, අළුත්ගම, බෝගමුව, යක්කල.
3. එන්. බී. එස්. දර්ශනී මිය, 276/15, සිරිලක් මාවත, මාකුඹුර, පන්නිපිටිය.
4. හේමන්තා බටගොඩ මිය, 89/12 ඒ, පරණ පාර, නාවින්න, මහරගම.
5. කෞමලී දිසානායක මිය, 177/ඒ, වෙදෙගම, පස්යාල.
6. නිලන්ත වීරක්කොඩි මයා, 230, උඩකුඹුර, පුස්සැල්ලාව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, අංක 114/9, විජේරාම මාවත, කොළඹ 07.

අතර පවත්නා 2024.07.19 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රමාල් අයි. සිරිවර්ධන මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු රමාල් අයි. සිරිවර්ධන මයා බේරුම්කාර ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2024.07.29 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

මහාචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 204/1

---

මගේ අංකය: IR/COM/01/2023/101.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණී මිය, 181/4බී, ජයතිලක මාවත, වරාගොඩ, කැළණිය.
2. ආචාර්ය පී. සී. ගිරිහාගම මයා, 206 එෆ්, ගල්ගේඩියන පාර, අළුත්ගම, බෝගමුව, යක්කල.
3. එන්. බී. එස්. දර්ශනී මිය, 276/15, සිරිලක් මාවත, මාකුඹුර, පන්නිපිටිය.
4. හේමන්තා බටගොඩ මිය, 89/12 ඒ, පරණ පාර, නාවින්න, මහරගම.
5. කෞමලී දිසානායක මිය, 177/ඒ, වෙදෙගම, පස්යාල.
6. නිලන්ත වීරක්කොඩි මයා, 230, උඩකුඹුර, පුස්සැල්ලාව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, අංක 114/9, විජේරාම මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන

වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල, අනගාරික ධර්මපාල මාවත, අංක 32/26 එල්, එම්. එම්. අයි. ආර්. ඒ. ජයතිලක මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මහාචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය .

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: මගේ අංකය: IR/COM/01/2023/101.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණී මිය, 181/4බී, ජයතිලක මාවත, වරාගොඩ, කැළණිය.
2. ආචාර්ය පී. සී. ගිරිහාගම මයා, 206 එෆ්, ගල්ගේඩියන පාර, අළුත්ගම, බෝගමුව, යක්කල.
3. එන්. බී. එස්. දර්ශනී මිය, 276/15, සිරිලක් මාවත, මාකුඹුර, පන්නිපිටිය.
4. හේමන්තා බටගොඩ මිය, 89/12 ඒ, පරණ පාර, නාවින්න, මහරගම.
5. කෞමලී දිසානායක මිය, 177/ඒ, වෙදෙගම, පස්යාල.
6. නිලන්ත වීරක්කොඩි මයා, 230, උඩකුඹුර, පුස්සැල්ලාව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, අංක 114/9, විජේරාම මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

“ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සේවය කරන පහත නම් සඳහන් නිලධාරීන්ගේ පත්වීම් ලිපි ප්‍රකාරව,

1. 2021 වසර සිට ලබා නොගත් වෛද්‍ය නිවාඩු නොගෙවීම් සහ
2. 2022 වසර සිට වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය නොකිරීම

මගින් ඔවුන්ට අසාධාරණයක් සිදුවී ඇත් ද, යන්නත් එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම්, ඔවුන්ට ලැබිය යුතු හිමිකම් කවරේ ද යන්නත් පිළිබඳව වේ.

1. ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණී මිය
2. ආචාර්ය පී. සී. ගිරිහාගම මයා
3. එන්. බී. එස්. දර්ශනී මිය
4. හේමන්තා බටගොඩ මිය
5. කෞමලී දිසානායක මිය
6. නිලන්ත වීරක්කොඩි මයා

2024 දෙසැම්බර් මස 03 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 204/2

මගේ අංකය : IR/COM/02/2021/178.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

පී. එම්. ජයන්ත මයා, අංක 499, ගහසිරිපුර, දෙබරවැව, තිස්සමහාරාම.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30, නීතිඥ සරත් ලියනගේ මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මහාචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. එම්. ජයන්ත මයා, අංක 499, ගහසිරිපුර, දෙබරවැව, තිස්සමහාරාම.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අම්බලන්තොට ඩිපෝවේ කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කරන පී. එම්. ජයන්ත මහතාට පහත අනු අංක (i) සිට (v) දක්වා ඉල්ලීම් / දීමනා, නොලැබීමෙන් / නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.

i. 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් නොකිරීම.

ii. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අංක ශ්‍රීලංගම/සමාසක/විනය/රුහුණුප්‍රා/159/2020 දරන 2020.11.23 දිනැති විනය නියෝගය මගින් කතරගම ඩිපෝවේ සිට අම්බලන්තොට ඩිපෝවට ස්ථානමාරු කර තිබිය දී, 2020.12.18 සිට 2020.12.31 දින දක්වා අම්බලන්තොට ඩිපෝවේ සේවයට වාර්තා කිරීමට අවස්ථාව ලබා නොදීම තුළ, 2020.12.18 සිට 2020.12.31 දින දක්වා වැටුප අහිමි වීම.

iii. වෘත්තීය සමිති කටයුතු වෙනුවෙන් මාසිකව ලබාදෙන රාජකාරි නිවාඩු දින 02, 2020 දෙසැම්බර් මාසය සඳහා ලබා නොදීම.

iv. 2021.02.07 හා 2021.02.21 යන දෙදින සේවයට වාර්තා නොකළ දින ලෙස සැලකීම.

v. 2021.01.10 දින සිට රාත්‍රී නැවතුම්පළ දීමනා නොගෙවීම."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.